# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2176/12 - 2020 මැයි මස 20 වැනි බදාදා - 2020.05.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : තිප්‍රාලේ/1/8/3/61 අත්.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොරැල්ල ගමේ (කොට්ඨාස අංක 33) බොරැල්ල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කර ඇති අංක කො. 9889 හා 2020.03.06 දිනැති මූලික පිඹුරෙහි කැබලි අංක 2 න් පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්. 0.0479 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

**කැබලි අංක 02**

| | |
|---|---|
| ඉඩමේ නම | : වරිපනම් අංක 265 (කොටසක්) පෙළෙන්ගස්තුඩුව පාර; |
| ඉඩම් පරිහරණය | : වත්ත; |
| ප්‍රමාණය | : හෙක්. 0.0479; |
| මුල් හිමිකම් කියන්නා | : සොයාගත නොහැක. |

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.06.19 වැනි දින පෙ. ව. 10.00 ට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2020.06.19 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය. හිමිකම් පෑමට සහාය වන සියලුම ඔප්පු හා වෙනත් ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

ප්‍රියන්තා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
තිඹිරිගස්යාය.

2020 මැයි මස 19 වැනි දින,
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 46